# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,162 — 1960 ජූලි 22 වැනි සිකුරාද — 22.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 151 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| අය-වැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම ... ... | — |
| මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 152 |


## අතුරු ව්‍යවස්ථා

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1960 ක්වූ ජූලි මස 14 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාව වෙත ගෙවිය යුතු මාසික අශුචි ඉවත්කිරීමේ ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එක බැගින් විය යුතු වන්නේ ය.

2. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත්කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාව වෙත ගෙවිය යුතු මාසික කසළ ශෝධන ගාස්තුව රුපියල් එක බැගින් විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල "කාර්‍ය සභාව" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

---

ජීබී 14/18/9.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම් පත්තුවේ නෙලුව-දෙල්ලව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථිර ලේකම් තැන.

1960 ජූලි මස 4 වැනි දින,
කොළඹ දී ය.

### ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. (i) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) කිසියම් ගම්බද පාරක් මැද සිට අඩි පහළොවක් දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) යථා කාලයෙහි දී ගම්බද පාරක් බවට පත් කරනු ලැබිය හැකියයි ගම්කාර්‍ය සභාව විසින්, දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි පහළොවක ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) මේ ඡේදයේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද මාවතකින් බාහිරවූ ඕනෑම ගම්බද මාවතක මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ, අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(ii) කිසිවකු විසින් ලියවිල්ලකින්වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳ ප්‍රධාන තුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරන ලද කිසියම් ගම්බද පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩ නැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය තුළ ඇතුළත සෑදිය යුතු නැත.

2. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාරක සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාරක සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ නෙලුව-දෙල්ලව ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

"ගම්බද පාර" යනුවෙන් කාරක සභාව මගින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූ ද පළලින් අඩි නවයකට අඩුවූ ද අඩු නොවූ ද පාරක් අදහස් කරනු ලැබේ.

"ගම්බද මාවත" යනුවෙන් කාරක සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූ ද පළලින් අඩි නවයකට අඩුවූ ද පාරක් අදහස් කරනු ලැබේ.

---

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමන්ගල්ල ගම් ප්‍රදේශයේ හමන්ගල්ල ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ජූලි මස 14 වැනි දින,
කොළඹ දීය.

### තොටුපලවල්

1. කාර්ය සභාව විසින් ගම් ප්‍රදේශය ඇතුළත තොටුපලක් පිහිටු වනු ලබන කල්හි, සභාපතිතුමා විසින් එම තොටුපල පිහිටුවනු ලබන බව අණබෙර ගැස්වීමෙන් දැනුම් දිය යුතුය.

2. කාර්ය සභාව විසින් පිහිටුවන ලද ඕනෑම තොටුපලක තොටුපල් ගාස්තු එකතු කිරීමේ අයිතිවාසිකම—

(අ) පෞද්ගලික ගිවිසුමකින්,

(ආ) ප්‍රසිද්ධ වෙන්දේසියකින්, හෝ

(ඇ) ටෙන්ඩර් කැඳවීමකින්,

ඕනෑම කෙනෙකුට බදුදීම කාර්ය සභාව විසින් කළ හැකිය.

3. කාර්ය සභාව විසින් පිහිටුවන ලද හෝ පිහිටුවා නඩත්තු කර ගෙන යනු ලබන ඕනෑම තොටුපලකින් අය කරණ සියලුම තොටුපල් ගාස්තු සභාපතිතුමා විසින් ලියවිල්ලකින් පත්කරණු ලබන තොටියකු විසින් හෝ බදුකරුවා විසින් හෝ සභාපතිතුමාගේ ලිය විල්ලකින්වූ අනුමතිය ඇතුව, බදුකාරයා විසින් පත්කරනු ලබන තැනැත්තා විසින් එකතු කළ යුතුය.

4. සභාපතිතුමා විසින් තොටුපල් පාවිච්චි කිරීම සඳහා ගෙවිය යුතු තොටුපල් ගාස්තු දක්වෙන සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ දැන්වීමක් තොටුපලේ කාටත් පෙනෙන ස්ථානයක පැහැදිලිව ප්‍රදර්ශනය කරවිය යුතු අතර, එකී දැන්වීමේ සඳහන් එම ගාස්තුවලට වඩා වැඩිවූ කිසිම ගාස්තුවක් කිසිවෙකු විසින් ඉල්ලා සිටීම හෝ ලබාගැනීම නොකළ යුතුය.

5. මගීන් ගෙනයාම සඳහා හෝ බඩු හෝ රථවාහන පටවාගෙන යාම සඳහා සපයා ඇති ඔරු පාරු ආදිය පාවිච්චි නොකරන කල්හි කිසියම් තොටුපලක් සම්බන්ධයෙන් පනවා තිබෙන තොටුපල් ගාස්තු නොවිය යුතුවාක් හැර අය කළ යුතුද නැත.

6. කාර්ය සභාව විසින් විධිමත් පරිදි තොටුපල් ගාස්තු පනවා තිබෙන, කිසියම් තොටුපලක ඉහළට හෝ පහළට සැතපුම් භාගයක දුරක හෝ එහි ඇතුළත විධිමත් පරිදි පත්කර තිබෙන තොටියෙකු ගෙන් බාහිරවූ කිසිවෙකු විසින් කිසියම් ඔරු පාරුවකින් හෝ වෙනත් යම් අන්දමකින් කිසිම ගඟක් හෝ ඇලක් හරහා තමන්ගේ දේපල නොවන කිසියම් බඩු බාහිරාදියක් හෝ රථ වාහනයක් හෝ සතකු හෝ තමා යටතේ සේවය නොකරණ කිසියම් මගියෙකු එගොඩ මෙගොඩ ගෙනයා යුතු නැත.

7. කාර්ය සභාවෙන් කලින් ලබාගත් අවසරයක් නොමැතිව ගම් ප්‍රදේශය ඇතුළත පෞද්ගලික තොටුපලක් පිහිටුවිය යුතු නැත.

8. කාර්ය සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන සියලුම තොටුපලවල් පිළිබඳ ලේඛනයක් තබාගැනීමට සභාපතිතුමා විසින් විධි විධාන සැලැස්විය යුතුය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමන්ගල්ල ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

## අතුරු ව්‍යවස්ථා

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මැද පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනු ලැබ ඒ බව පළාත් පාලන පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන විසින් වර්ෂ 1955ක්වූ පෙබරවාරි මස 18 වෙනි දින නො. 10,768 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථාවේ සිංහල පරිවර්තනයේ දක්වෙන "රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්වීම හා සෑදීම" යන වගන්තිය **"රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්වීම හෝ සෑදීම"** කියා සංශෝධනය වියයුතු බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

---

# අය-වැය ලේඛන

## කොලොන්නාව නගර සභාව

### 1960 වර්ෂයේ දෙවැනි අතිරේක වැය ලේඛනය

| වැය ශීර්ෂය | | | මුදල රු. ශ. |
|---|---|---|---|
| ඒ. 2 (කේ) | ... | ... | 1,500 00 |
| එච්. 4 | ... | ... | 750 00 |
| ජේ. 4 (ජී) | ... | ... | 1,000 00 |
| ඊ. 5 (ඊ) | ... | ... | 480 00 |
| | | | 3,730 00 |

වර්ෂ 1960 ක්වූ ජූනි මස 21 වැනි දින කොලොන්නාව නගර සභාවේ පවත්වන ලද කල් තබන ලද මාසික රැස්වීමේ යෝජිත අංක 29 යටතේ පිළිගෙන ස්ථිර කරන ලදී.

වී. ඇස්. ගුණදාස සිල්වා,
කොලොන්නාව පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
කොලොන්නාව, වැල්ලම්පිටිය.
13.7.60.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.